
# 1 පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණය



1.1 රූපය - ශුද්ධ බයිබලය

දේව අනාවරණයේ ලිඛිත මූලාශ්‍රය වන ශුද්ධ බයිබලය කිතුනුවන්ගේ අති පූජනීය ග්‍රන්ථය යි. එය එක් පොතක් නොව පොත් සමූහයකින් සමන්විත පුස්තකාලයකි. එහි ඇති පොත් හැත්තෑතුන ම ලියවී ඇත්තේ දේවානුභාවයෙනි.

ශුද්ධ බයිබලයෙහි ප්‍රධාන කර්තෘ දෙවියන් වහන්සේ වන අතර උපකාරක කර්තෘ මිනිසා වේ. ක්‍රි.පූ. 950-ක්‍රි.ව.100 අතර කාලය තුළ ශුද්ධ බයිබලය ලේඛන ගත ව ඇති බව සාමාන්‍ය පිළිගැනීම යි. ශුද්ධ බයිබලය ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය. එනම්, පුරාණ ගිවිසුම හා නව ගිවිසුම යි. පුරාණ ගිවිසුමේ පොත් 46ක් ඇති අතර ඒවා කොටස් 5කට බෙදිය හැකි ය.

**පුරාණ ගිවිසුම (පොත් 46)**

**නීති පොත්**
1. උත්පත්ති
2. නික්මයාම
3. ලෙවී ව්‍යවස්ථාව
4. ගණන් කථාව
5. ද්විතීය නීති සංග්‍රහය

**ඉතිහාස පොත්**
1. ජෝෂුවා
2. වීරාවලිය
3. රූත් කථාව
4. 1 සාමුවෙල්
5. 2 සාමුවෙල්
6. 1 රාජාවලිය
7. 2 රාජාවලිය
8. 1 වංශාවලිය
9. 2 වංශාවලිය
10. එස්රා
11. නෙහෙමියා
12. තෝබිත්
13. ජුඩිත්
14. එස්තර්
15. 1 මකබි
16. 2 මකබි

**ප්‍රඥා සාහිත්‍යය**
1. ජෝබ්
2. ගීතාවලිය
3. හිතෝපදේශය
4. ධර්මදේශකයා
5. ප්‍රේම ගී
6. ප්‍රඥාව
7. සිරාක්

**දිවැසිවර ග්‍රන්ථ**
1. යෙසායා
2. ජෙරමියා
3. විලාප ගී
4. බාරුක්
5. එසකියෙල්
6. හොසියා
7. ජෝවෙල්
8. ආමොස්
9. ඔබදියා
10. ජෝනා
11. මීකා
12. නාහුම්
13. හබක්කුක්
14. ශෙපනියා
15. හග්ගායි
16. සෙකරියා
17. මලාකි

**එළිදරව් සාහිත්‍යය**
1. දනියෙල්

## ශුද්ධ බයිබලයේ ඉතිහාස පොත්

පුරාණ ගිවිසුම තුළ අඩංගු වන්නේ, ගැලවීමේ ඉතිහාසය යි. ගැලවීමේ ඉතිහාසය යනු ඓතිහාසික සිදුවීම්, කාල වකවානු, පුද්ගල චරිත යනාදිය පිළිබඳ හුදු වාර්තාකරණයක් නොවේ. ඉශ්‍රායෙල් ජනතාවගේ අත්දැකීම්, සිද්ධීන් යනාදිය විශ්වාසයේ ඇසින් අර්ථකථනය කිරීමකි. ඒ මන්ද යත් එහි පරමාර්ථය දේව විශ්වාසය වර්ධනය කිරීම යි. විවිධ සිද්ධීන් තුළ ඉශ්‍රායෙල් ජාතිය දෙවියන් වහන්සේ අත්දුටු ආකාරය මෙහි අඩංගු ය. මෙහි ඉතිහාස පොත් 16කි. ඒවා ඉහත සටහනින් හඳුනා ගන්න.

ජෝෂුවා සිට 2 රාජාවලිය දක්වා පොත් අධ්‍යයනයේ දී පැහැදිලි වන කරුණක් වනුයේ සීනයි ගිවිසුමට (දස පනතට) පක්ෂපාතී ව කටයුතු කරන තරමට නායකයකුගේ හෝ ඉශ්‍රායෙල් ජාතියේ නැගීම හෝ වැටීම සිදු වූ බව යි. එනම්, ගිවිසුමට පක්ෂපාතී වීම දේව ආශිර්වාදය ලැබීමට හේතු වන අතර, එයට පිටුපෑම පුද්ගලයාගේ හෝ ජාතියේ වැටීමට හේතු වන බව ය. එහෙයින් සීනයි ගිවිසුමට හෙවත් දස පනතට අනුව ජීවත් වන තරමට අපට ද දේව ආශිර්වාදය හිමි වේ.

රූත් කථාව හා එස්තර්, ජනප්‍රිය ඓතිහාසික කෘතින් 2කි. ඒවායෙහි පුද්ගලයින් හෝ ජනතාවගේ ගැටලු හා ඒවාට විසඳුම් දේව වේදීය දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කර ඇත.

එස්රා හා නෙහෙමියා පොත්වල මූලික ව ම සඳහන් වන්නේ, බබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සමාජයීය හා ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ කරුණු ය.

මේ අනුව බලන කල, පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් දේව වේදීය ඉතිහාස කතා ලෙස හැඳින්විය හැකි අතර, ඒවායින් සනාථ වන්නේ, මිනිස් ඉතිහාසය තුළ දෙවියන් වහන්සේ ක්‍රියාකාරී වන බව ය.

## ශුද්ධ බයිබලය හා ජීවන සභා සම්ප්‍රදාය

කතෝලික ධර්මය දේව වචනය මත පදනම් වූවකි. දෙවියන් වහන්සේ ලෝකය මවා වදාළේ ද දේව වචනයේ බලයෙනි. මෙම දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට දයාද කරන ලද්දේ වාචික සම්ප්‍රදාය තුළිනි. උදහරණයක් ලෙස, නව ගිවිසුමේ පළමු සුබාරංචි ග්‍රන්ථය වන්නේ මාක් සුබාරංචිය ය. එය ලේඛන ගත වූයේ ක්‍රි.ව. 64-66 කාලයේ දී ය. එතෙක් ක්‍රිස්තුන් වහන්සේ වදාළ කිසි ම වචනයක් සුබාරංචියකට ගොනු වී නොතිබිණි. එතැන් සිට ක්‍රිස්තුන් වහන්සේ කළ කී දේ සුබාරංචි හතරකට ගොනු වුව ද එලෙස ලේඛන ගත වූයේ උන්වහන්සේ කළ කී දේවලින් අතලොස්සක් පමණි. එයට ජොහන් සුබාරංචිය මෙලෙස සාක්ෂි දරයිඃ "මේ පොතෙහි ලියා නැති වෙනත් බොහෝ හාස්කම් ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් ඉදිරියෙහි සිදු කළ සේක"(ජොහන් 20:30). "ජේසුස් වහන්සේ කළ තවත් බොහෝ දේ ඇත. ඒවා එකින් එක ලීවොත් ලියවෙන ඒ පොත්වලට මුළු ලෝකය වුවත් ඉඩ මදි යයි සිතමි"(ජොහන් 21:25).

මේ අනුව ලේඛන ගත වී නැති ජේසුස් වහන්සේ කළ කී දේ බොහෝ ඇති බව පැහැදිලි ය. ඒවා ශු. සභා මාතාව විසින් අපට "ජීවන සභා සම්ප්‍රදාය" ඔස්සේ දනය කරන්නී ය.

ජීවන සභා සම්ප්‍රදය තුළ අඩංගු ඉගැන්වීම් ද දේව වචනය වන්නේ ය. එම දේව වචනය ද සදහට ම පවතී. එය ශුද්ධ වූ පේදුරු තුමාගේ වචනවලින් පැහැදිලි වේ. "ස්වාමීන් වහන්සේගේ වචනය සදහට ම පවතියි. මේ වචනය නම් ඔබට "දේශනා කරන ලද" සුබ අස්න ය (1 පේදුරු 1:25).

මේ අනුව දේව වචනයේ (අනාවරණයේ) මුලාශ්‍ර දෙකකි.

1. ශුද්ධ බයිබලය
2. ජීවන සභා සම්ප්‍රදය (Living Tradition of the Church)

ජීවන සභා සම්ප්‍රදය තුළ අපෝස්තුලුවරුන්ගේ සිට පැවත එන ඉගැන්වීම් අන්තර්ගත වේ. මෙය කතෝලික සභාවේ අනන්‍යතාව මැනවින් විදහා දක්වයි. මන්ද යත් අන් සැම කිතුනු සභාවක් ම පසු ව ආරම්භ වුව ද කතෝලික සභාව අපෝස්තුලුවරුන්ගේ සිට පැවත එන අතර අපෝසතුලුවරුන්ගේ සිට පැවත එන සභා සම්ප්‍රදයයන් ද කතෝලික සභාව සතු බැවිනි. එබැවින් එම සම්ප්‍රදයන් පිළිපදිමින් ඒවා තුළ අන්තර්ගත ඉගැන්වීම් හා වත්පිළිවෙත් කතෝලික සභාව අනුගමනය කරන්නේ ය. ශුද්ධ බයිබලයේ අන්තර් ගත නොවන යමක් ශුද්ධ වූ කතෝලික සභාව අනුගමනය කරන්නේ ද ඒවා ජීවන සභා සම්ප්‍රදයයෙන් ලැබී ඇති අතර ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලෝකය තුළ තව දුරටත් ඒවා පෝෂණය වී ඇත්තේ ය.

## ක්‍රියාකාරකම

1. දේව අනාවරණයේ ප්‍රධාන මුලාශ්‍ර දෙක නම් කරන්න.
2. ශුද්ධ බයිබලයේ අඩංගු නොවන නමුත් කතෝලික සභාව අනුගමනය කරන හා උගන්වන කරුණු ලැබී ඇත්තේ කුමන මුලාශ්‍රයකින් ද?
3. පුරාණ ගිවිසුමේ පොත් වර්ගීකරණය අනුව නික්මයාම, ජෝෂුවා, ගීතාවලිය, ජෙරමියා හා දනියෙල් පොත් අයත් පොත් කාණ්ඩ වෙන වෙන ම නම් කරන්න.
4. ආගමික ඉතිහාසයක් යනු කුමක් ද?
5. ඔබගේ ජීවිතය තුළ දෙවියන් වහන්සේ අත්දුටු අවස්ථාවක් ලියන්න.

*ජීවිතය සඳහා*

- *එදිනෙදා ජීවිත ප්‍රශ්නවලට පිළිතුරු ශුද්ධ බයිබලයෙන් සොයමු.*
- *අප ජීවිත තුළ ක්‍රියා කරන දෙවියන් වහන්සේ ව හඳුනා ගනිමු.*
- *දස පනත අනුසාර කරමින් දැහැමි ජීවිතයකට යොමු වෙමු.*
- *ජීවිත සංසිද්ධීන් දෙස විශ්වාසයේ ඇසින් බලමු*
- *දුක් කම්කටොලු බාධක ප්‍රශ්න හමුවේ විකල්ප මාර්ග කරා යොමු නොවී, විශ්වාසයට සාක්ෂි දරමු.*